7 ශ්‍රේණිය-iii-වාරය-03

# නූර්ති ගීත ගායනය.

උත්තර භාරතීය හිංදුස්ථානී සංගීත ආභාෂය ලැබූ නූර්ති ගීත ඉතා මිහිරිය.අඹ දඹ නාරං,දන්න වංහුං,සුවඳ පත්ම වැනි නූර්ති ගීත මේ වන විට ඔබ ඉගෙන ගෙන ඇත.නීතිඥ ජෝන්ද සිල්වා මහතා විසින් නිර්මාණය කරන ලද විදුර නූර්තියේ එන පහත ගීය අසා රසවිදින්න.

**විදුර නූර්තිය- නීතිඥ ජෝන්ද සිල්වා මහතා**

{{දම්වැසි වස්සන ලෝකේ- විදුරපඬී


නොදැක වේය මා ළය ශෝකේ- විදුරපඬී}}

රෝග ලීල දක්වලා ප්‍රයෝගෙන් //

ගෙන්වමි ඒ පඬිදුන් මෙහි නා ලෝ //

ශ්‍රවන කරන සේ මධුර බණ කතා

එතුමාගේ... විදුරපඬී //



පැවරුම-

01.නූර්ති ගීත,ඒවා ඇතුළත් නාට්‍ය හා ඒවායෙහි නිර්මාණකරුවන් ඇතුළත් ලැයිස්තුවක් සකස් කරන්න.

02.නූර්ති ගීත සඳහා වාදනයට යොදාගත් සංගීත භාණ්ඩ සොයා ලියන්න.

03.ඉහත ගීය අසා රසවිඳින්න.

04. ඉහත ගීය සටහන් තබාගෙන ගායනය පුහුණු වන්න.

### උපදේශාත්මක ගී

හිතන්නකෝ අයියේ - දැන්වත් හැදෙන්නකෝ අයියේ
දඟ ළමයින් නරකයි බෝ සැරයි
හොඳ ළමයට කවුරුත් ආදරෙයි
සෙල්ලම ලෙල්ලම වෙනවාමයි
ඒකෙත් ඇස් රතු වෙනවාමයි

මැර කොල්ලන් එක්කල හාදකම්
උඩ පැනිලී නැවිලී නාඩගම්
හොඳ නෑ කැතයි - චී චී කැතයි
ලැජ්ජා නැද්දෝ -
හිතන්නකෝ අයියේ ....

එකටෙක නොකියා වාද වෙලා
ගුරු දෙගුරුන් හට මෙල්ල වෙලා
හැදුනේ නැත්නම් අයියා මගේ
බලු වලිගේ වාගේ මයි ඇඳේ
හොඳ නෑ කැතයි, චී චී කැතයි
ලැජ්ජා නැද්දෝ ...

පොඩි අපි දෙන්නා ඇස් දෙක වාගේ අම්මා සළකාවී
උදේ සවස වැඳ පුදන්න අම්මා
දෙවියොත් සළකාවී හා හා..
හොරකම් මැරකම් එපා එපා
බොරු කීවෝතින් පව් සිදුවේවී
නංගී පොඩි හැම කාලෙදී
අයියා ගාවයි.
හිතන්නකෝ .......

ගායනය - ඉන්ද්‍රාණි විජේබණ්ඩාර
පද මාලාව - කරුණාරත්න අබේසේකර

### උපදේශාත්මක ගී

හොඳ හොඳ ළමයින් අපි වාගේ
මේ මවබිම ඉපදී ඉන්නේ
අත් පොඩි ටික එකමුතු කරලා
රකිමු අපේ සිරිලක් අම්මා//

හොරකම් මැරකම් නැතිව ලොවේ
සිටියොත් හොඳ නම නිතර ලැබේ
වැරදි කළොතින් පව් සිදු වේවී
සමාව නම් කිසි දිනෙක නැතේ
පොඩි ළමයින්හට දෙවියන්ගේ
ආශිර්වාදය මයි ඔනේ

අත් පොඩි ටික.......

අම්මාගෙන් කරුණාව සෙනේ
විරිය දහිරිය පියතුමගේ
මේ හැම ලැබුණොත් එකවාගේ
මුළු ලෝකේම එයි අතට අපේ
පොඩි අයමයි ලොකු අය වෙන්නේ
කෝපය හින්දයි පොඩි වෙන්නේ
හිත තුල වෛරය නැති කරලා
ඉන්න ඕනේ හොඳ ළමයි වෙලා
අත් පොඩි ටික......

ගායනය - ඉන්ද්‍රාණි විජේබණ්ඩාර
පද මාලාව - විල්ෆ්‍රඩ් සිල්වා



පැවරුම-

01.ඉහත ගීත වලින් ඔබට ලබාදෙන උපදෙස් ලියන්න

02.අන්තර්ජාලය හෝ වෙනත් ක්‍රම මඟින් උපදේශාත්මක ගී අසා රසවිදින්න.

03. උපදේශාත්මක ගීත රචකයින් සහ ගායක/ගායිකාවන්ගේ ලැයිස්තුවක් සකසන්න.

04. . උපදේශාත්මක ගීත වලින් ඇති ප්‍රයෝජන ලියන්න.

05. . උපදේශාත්මක ගීත ලැයිස්තුවක් සකසන්න.